ශ්‍රී ලංකාවේ මිනිස් නොවන ප්‍රිමාටා ජනශ්‍රැතිය පිළිබඳ කෙටි විමර්ශනයක්

හැළඹ අමරවංස හිමි සහ සී. ඒ. ඩී. නාහල්ලගේ
සමාජ විද්‍යා සහ මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
hdamara@gmail.com

අතීතයේ පටන් ප්‍රිමාටාවන් මිනිසාට සමීප ඥාතිත්වයක් ඇතැයි සැලකූ හෙයින් ඔවුන් පිළිබඳ ජනශ්‍රැතිකාංග ගොඩනැගී තිබේ. එම මිනිස් නොවන ප්‍රිමාටා ජනශ්‍රැතිය, මෙහිදී කෙටි වර්ගීකරණයක් ඔස්සේ, මානවවංශප්‍රිමාටා විද්‍යාත්මක ප්‍රවේශයකින් විමර්ශනය කෙරේ.

පර්යේෂණයේ ප්‍රධාන අරමුණු වූයේ, සිරිලක ව්‍යවහාරික මිනිස් නොවන ප්‍රිමාටා ජනශ්‍රැතිය හඳුනා ගැනීමත්, ප්‍රිමාටාවන් පිළිබඳ මානව ආකල්පය සහ එහි කෘත්‍යමය වැදගත්කම, ඓතිහාසික, සාමාජීය හා ආගමික අවකාශය ඔස්සේ මානවවංශප්‍රිමාටා විද්‍යාත්මක ප්‍රවේශයකින් විමර්ශනයට බඳුන් කිරීමයි.

පර්යේෂණ ක්‍රමවේදය සඳහා සාහිත්‍යය විමර්ශනයක් සහ ක්ෂේත්‍ර පර්යේෂණයක් මගින් තොරතුරු එකරාශී කරන ලදී. සාහිත්‍යය විමර්ශනයේදී ලංකාවේ දක්නට ලැබෙන සිංහල, පාළි හා සංස්කෘත සාහිත්‍ය කෘතීන් ද, සෙල්ලිපි චිත්‍ර කැටයම් ප්‍රතිමා ආදි මූලාශ්‍රය ද යම් පමණකට විමසා බැලේ. තවද අගලවත්ත ප්‍රදේශයේ ග්‍රාම සේවා වසම් දෙකකින් ජනගහනයෙන් 5% ක නියැදියක් තෝරාගෙන ක්ෂේත්‍ර පර්යේෂණයක් කළ අතර එහිදී නිරීක්ෂණය සහ අර්ධ ආකෘතිමය සම්මුඛ සාකච්ඡාව මගින් තොරතුරු රැස් කරන ලදී.

ලංකාවේ මිනිස්නොවන ප්‍රිමාටා ජනශ්‍රැතිය ප්‍රධාන සංරචක තුනක් තුළ හඳුනාගත හැකිය. එනම්, බෞද්ධ, සංස්කෘත සහ සිංහල ජනශ්‍රැති වශයෙනි. බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථයන්හි දැක්වෙන, මිනිස් නොවන ප්‍රිමාටාවන් පිළිබඳ සටහන් ප්‍රභේද 4 ට සංග්‍රහ කළ හැකිය. එනම්, කතන්දර (ජාතකට්ඨකථාව - *ජාතක* 33 කි, ධම්මපදට්ඨකථාව, රසවාහිනිය, උදාන පාළි), ගාථා හා කවි (ථෙර-ථෙරී ගාථා, ධම්මපදය, ජාතක, බුදුගුණාලංකාරය), ප්‍රස්තාව පිරුළු (මජ්ඣිම නිකාය, සංයුත්ත නිකාය), සහ උපමා (නිකාය ග්‍රන්ථ) වේ.

සංස්කෘත සාහිත්‍යාගත ප්‍රිමාටාජනශ්‍රැතිය වීරකථා (රාමායණය, ජානකීහරණය, අභිෂේකනාටක), දොහදගණයේ කථා (පංචතන්ත්‍රය, හිතෝපදේශය), උපදේශාත්මක කථා (පංචතන්ත්‍රය - කථා 5කි, හිතෝපදේශය, කථාසරිත්සාගරය), පරිකල්පිතකථා (සෞන්දරනන්දය, භෝජප්‍රබන්ධය) ලෙස සරල වර්ගීකරණයක් කළ හැකිය.

තවද සිහළ ප්‍රිමාටා ජනශ්‍රැතිය සංරචක 11ක් යටතේ සංග්‍රහ කළ හැකිය. කතන්දර, කවි හා රබන් පද, තේරවිලි, ප්‍රස්තාවපිරුළු හා උපමා, ගේයපද රචනා, යන්ත්‍ර-මන්ත්‍ර හා ජ්‍යොතිෂ්‍ය, චිත්‍ර කැටයම් හා ප්‍රතිමා, ග්‍රාමනාම හා පුද්ගලනාම, බෙහෙත්, යාතුකර්ම, සැරසිලි සහ භාණ්ඩ යනුයි.

ලංකාවේ ප්‍රිමාටා ජනශ්‍රැතිය සමස්තයක් ලෙස ගත් කළ පෙනෙන්නේ මිනිසුන් ප්‍රිමාටා චර්යාව තියුණු නිරීක්ෂණයකට බඳුන් කර ඇති බවකි. අතකින් ප්‍රිමාටාසතුන් බුද්ධිමත්, ගෞරවණීය සත්ත්වයකු ලෙස සලකන අතර ඇතැම් විට චංචල, අවිනීත, කුහුලින් යුත් සත්ත්වයකු ලෙසින් ද හඳුන්වයි. මෙවන් සන්දිග්ධතා ඇතිවීමට හේතුව ප්‍රිමාටාවන්ට මානුෂීය ගුණාංග ආරෝපණය කිරීමයි.

ප්‍රමුඛ පද: *මිනිස්නොවන ප්‍රිමාටා ජනශ්‍රැතිය, මානවවංශ ප්‍රිමාටා විද්‍යාව, ප්‍රිමාටා චර්යාව*